මම කවදත් සතුන්ට ආදරෙයි.
මගේම කියලා හුරතල් සතෙකු
තියා ගන්ට මම ආසා කළා.

ඒත් මගේ අම්මා නම් ඒ අදහසට කිසිම
කැමැත්තක් දැක්වූයේ නෑ.

"අපට බල්ලො දෙන්නෙක් ඉන්නවා.
පොකුණෙ මාළු ඉන්නවා.
චූටි මල්ලියෙකුයි නංගියෙකුයි ඉන්නවා.
තවත් මොකට ද හුරතල් සතෙක්?"

(c) Sumitha Publisher

හුරතලෙකු ඇති කිරීම ගැන
මං කී හැම වෙලාවෙම අම්මා කීවෙ
ඔය ටිකයි.





(c) Sumitha Publisher

දවසක් අපි හුරතල් සතුන් විකුණන සාප්පුවක විසිතුරු මාළු තෝරා තෝරා හිටියා.

නැවත වතාවක් මගේ ආසාව හරි යයිද කියලා බලන්ට හොඳ වෙලාව කියලා මට හිතුණා.
“අම්මෙ අනේ අම්මෙ මට හාවෙක් ඇරන් දෙනවා ද?”
“අපෝ බෑ, බල්ලො එයාව කයි”



(c) Sumitha Publisher



(c) Sumitha Publisher

මං එයාව දැක්කෙ එතකොටම යි.
පුංචි ටැංකියක ලස්සනට පීන පීන හිටියා.
එයා මං දිහා බැලුවෙ
යාළු වෙන්ට වගේම යි.